# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට දුම්රිය ස්ථානවල පිහිටා ඇති සනීපාරක්ෂක ගොඩනැගිලි බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් දුම්රිය ස්ථානවල පවතින සනීපාරක්ෂක ගොඩනැගිලි වසර දෙකක කාලයකට බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | සනීපාරක්ෂක ගොඩනැගිලි පිහිටා ඇති දුම්රිය ස්ථානය | අනු අංකය | සනීපාරක්ෂක ගොඩනැගිලි පිහිටා ඇති දුම්රිය ස්ථානය |
|---|---|---|---|
| 01 | ඇල්ල | 15 | පොල්ගහවෙල |
| 02 | ඕහිය | 16 | රාගම |
| 03 | හපුතලේ | 17 | ගම්පහ |
| 04 | පට්ටිපොල | 18 | මරදාන |
| 05 | නානුඔය | 19 | දකුණු කළුතර |
| 06 | හැටන් | 20 | බෙන්තොට |
| 07 | මාතලේ | 21 | හික්කඩුව |
| 08 | නාවලපිටිය | 22 | ගාල්ල |
| 09 | පේරාදෙණිය | 23 | උණවටුන |
| 10 | කඩුගන්නාව | 24 | හලාවත |
| 11 | ඉහල කෝට්ටේ | 25 | පුත්තලම |
| 12 | රඹුක්කන | 26 | ත්‍රිකුණාමලය |
| 13 | මහනුවර | 27 | මඩකලපුව |
| 14 | කුරුණෑගල | | |

**01.සුදුසුකම්**

වැඩිම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුවන්ට උක්ත සනීපාරක්ෂක ගොඩනැගිලි බදු ලබාදීමට කටයුතු කරනු ඇත.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ප්‍රසම්පාදන ලියවිලි 2023 ජූලි මස 18 වන දින ප.ව 2.00 දක්වා දුම්රිය මූලස්ථානයේ වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ අදාල දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත හෝ අදාල දුම්රිය ස්ථානය වෙත ආපසු නොගෙවනු ලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත දුම්රිය ස්ථානාධිපති වෙත හෝ දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරි (වෙළඳ හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කර මුදලද ගෙවිය යුතුය.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසිපරිදි සම්පූර්ණ කරකවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය.එම කවර දෙක තනිකවරයක බහා වම් පසඉහල කෙළවරේ "සනීපාරක්ෂක ගොඩනැගිලි බදු ලබාදීම සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කොට, එමකවරය මුද්‍රා තබා 2023 ජූලි මස 19 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

2023 ජූලි මස 19 වන දින ප.ව. 02.00 ට ඉහත 03 ජේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**06.** ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාල සනීපාරක්ෂක ගොඩනැගිලි පරීක්ෂාකල හැකි අතර ඒ සඳහා අදාල දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙතින් අවසර ලබාගත යුතුවේ.

**07.**ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) ෆැක්ස් :- 011-2431909 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෙළඳ හා අලෙවි කාර්යාලය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.